# මෑත කාලීන පාලි භාෂා අධ්‍යයනයේ ඇති වූ නව ප්‍රවණතා හා ඒවායෙහි දිර්ඝ කාලීන බලපෑම්

---

ථෙරවාදී ත්‍රිපිටක ධර්මය හා අටුවා ග්‍රන්ථ ආරක්ෂා වී ඇති ප්‍රාථමික මුලාශ්‍ර භාෂාවක් වශයෙන් පාලිය අපට වැදගත් වේ. ථෙරවාදී බුදු දහමේ සම්ප්‍රාප්තියත් සමග ශ්‍රී ලංකාවේ පාලි භාෂා අධ්‍යයන ආරම්භ වේ. එම අධ්‍යයනයන්හි ප්‍රධාන අංශ දෙකක් විද්‍යාමාන බව පැවසිය හැකිය. ඒවා නම් පාලි භාෂාවවාචෝද්ගත මාර්ගයෙන් ප්‍රගුණ කිරීම හා තදනුබද්ධව ධර්මය ඉගෙනීම හා දේශනා කිරීමයි. මේ නිසා පාලි භාෂා අධ්‍යයන පදනම් කරගත් ධර්ම ශාස්ත්‍රීය අධ්‍යයන ආයතන රාශීයක් බිහි වූ අයුරු අනුරාධපුර යුගයේ සිටම දැක ගත හැකිය. ඒවා අතර මහා විහාරය, අභයගිරිය හා ජේතවන යන මුලස්ථාන හා තදනුබද්ධ සෙසු ආයතනයන් වැදගත් වේ. ඉහත සඳහන් පාලි භාෂා අධ්‍යයනයන්හි පැවැති ප්‍රධාන අංශද්වය ප්‍රගුණ කිරීමෙන් බිහිවූ ගිහි පැවිදි පාලි උගතුන් ශ්‍රී ලාංකේය ඉතිහාසය පුරාම දැකිය හැකිය. එම පඬිවරුන්ගේ පාලි භාෂා ඥානයේ හා ධර්මඥානයේ මහිමය ඔවුන් විසින් ලියන ලද කෘති වලින් ප්‍රකට වේ. යම් යම් උපද්‍රව කාල වකවානු හැර මෙම සාම්ප්‍රදායික ථෙරවාදී පාලි භාෂා අධ්‍යයන ශ්‍රී ලාංකේය ඉතිහාසය පුරා මහත් ඉහලින් සිදු වූ බව පැවසිය හැකිය.

මෙම ප්‍රවණතා 20 වන සියවසේ මුල් භාගයේ දී එලෙසම දැකිය හැකිය. ඒ බව මේ යුගයේ පාලි භාෂා අධ්‍යයන වල නියැලුණු පඬිවරුන් විසින් දායද කරන ලද ශාස්තයය පොත පත හා ඔවුන් ලබා තිබූ ජාත්‍යන්තර කීර්තිය නිදර්ශන වශයෙන් පෙන්වා දිය හැකිය. එහෙත් 20 වන සියවසේ අග භාගය වන විට මෙම තත්ත්වය ක්‍රමයෙන් වෙනස් වන්නට විය. ඉහත සඳහන් කළ දියුණු පාලි භාෂාමය අධ්‍යයනවල ප්‍රගතිය හා සසඳන විට එය මෙම යුගයේ ක්‍රමයෙන් පරිහානියට පත් වී ඇති බව පෙන්නුම් කෙරේ. මෙම මෑත යුගයේ විශ්වවිද්‍යාල ආරම්භ වී ඒවායෙහි පාලි භාෂා අධ්‍යයන අංශ එසේම ප්‍රාචීන භාෂෝපකාර සමාගම බඳු ආයතන බිහිවුවත් එය අපේක්ෂිත පරිදි සංවර්ධනය නොවීම ගැටලුවකි. පාලි භාෂාවේ මෙම අවපාතයට බලපෑ කරුණු කාරණා බොහෝ තිබිය හැක. ඒවා අතර ප්‍රධානම හේතු සාධක කියයක් පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම ලිපියේ අරමුණ වේ.

**හැඳින්වීම**

වර්තමාන ශ්‍රී ලංකාවේ පාලි භාෂා අධ්‍යයන, මීට දශක පහකට හයකට පෙර තත්වය හා සසඳන විට අවපාතයකට ලක්ව ඇති බව ප්‍රකාශ කිරීම එය අවතක්සේරු කිරීමක් නොවේ. මේ සඳහා විවිධ හේතු සාධක ඇති බව පෙන්වාදිය හැකිය. මෙම ලිපියේ අරමුණ වර්තමාන ශ්‍රී ලාංකේය පාලි භාෂා අධ්‍යයන වල පරිහානියට බලපෑ ප්‍රධාන හේතු සාධක දෙකක් පිළිබඳ පරීක්‍ෂා කර බැලීමයි. එමනිසා මෙම ලිපියෙන් ඉදිරිපත් කෙරෙන කරුණු මේ සඳහා බල පෑ සමස්ත කරුණු පිළිබඳ අධ්‍යයනයක් නොවන අතර තෝරාගත් ක්‍ෂෙත්‍රයන් තුළ පමණක් කෙරෙන විමර්ශනයක් බව සැළකිය යුතුය.

**ඓතිහාසික තත්වය**

ශ්‍රී ලංකාවේ පාලි භාෂා අධ්‍යයන පිළිබඳ ඉතිහාසය ක්‍රිස්තු පූර්ව යුගය තරම් ඈතට දිව යන්නකි. ශ්‍රී ලංකාවට පාලි භාෂාව හඳුන්වා දීම, ථේරවාදී බුදු දහමේ ලංකාගමනයත් සමග සිදුවුවකි. ඊට හේතුව ථේරවාද බුදුසමයට අයත් ත්‍රිපිටක ග්‍රන්ථ ලියැවී ඇතිව භාෂාව පාලිය වීමයි. එහෙයින් අලුතින් ආ බුදුදහම වැළඳ ගත් භික්‍ෂු භික්‍ෂුණි යන උභය පාර්ශවයටම විශාල ක්‍ෂණික වගකීමක් දැරීමට සිදුවිය. එය අංශ ද්වයක් තුළ විහී ද ඇති බව පෙන්වා දිය හැකිය.

වාචෝද්ගත (කටපාඩමින්) සම්ප්‍රදායකින් පාලි ත්‍රිපිටක ග්‍රන්ථ ආරක්‍ෂා කිරීම.

දේශනා කිරීමෙන් හා ඉගැන්වීමෙන් ධර්මප්‍රචාරය හා ධර්මය තහවුරු කිරීම.

මෙම වගකීම් දෙක සපුරාලීම සඳහා පාලි භාෂා ඥානය අත්‍යවශ්‍ය විය. ශ්‍රී ලාංකේය මුල් කාලීන බෞද්ධ ඉතිහාසය තුළ ඇති වු සිදුවීම් රාශියක් මේ සඳහා උදාහරණ වශයෙන් පෙන්වා දිය හැකිය. ඒවා අතර පාලි අට්ඨකථා සිංහලයට පරිවර්තනය කිරීම අවශ්‍ය වුයේ පාලියෙන් රචිත එම අටුවා ග්‍රන්ථ කියවා තේරුම් ගැනීමට අපහසු වු නිසා විය හැකිය.[1] මෙය අලුතින් ලංකා ශාසනයේ ප්‍රව්‍රජ්ජාව ලත් භික්ෂු භික්‍ෂුණීන්ට තම ප්‍රතිපත්ති පුරණයට අමතරව දැරීමට සිදු වු අතිරේක වගකීමක් ද විය. මෙම පාලි අට්ඨකථා පරිවර්තන ව්‍යාපෘතිය එතරම් සුළු පටු එකක් නොවන්නට ඇතැයි සැකයකින් තොරව තීරණය කළ හැක්කේ ඒ සඳහා සිංහල හා පාලි යන භාෂාද්වයේම මනා නිපුණත්වයක් ඇති පඬිවරුන් අවශ්‍ය වන්නට ඇති බව කල්පනා කිරීමෙනි. මෙම අතිවිශාල කාර්යභාරයේ දී භාරතයෙන් පැමිණි ධර්මදූතයන් වහන්සේලා කිපනම පමණක් ප්‍රමාණවත් නොවන්නට ඇත. එමනිසා දේශීය සම්පත් දායක පිරිසක් මේ සඳහා පුරුදු පුහුණු කරවන්නට අවශ්‍ය විය. එහෙයින් භික්‍ෂු භික්‍ෂුණින් වැඩ වාසය කළ ආවාස නමින් හැඳින් වු බෞද්ධ විහාරස්ථානය ඉතාමත් මුල් යුගයේ දී ම පිරිවෙණ නම් වු අධ්‍යාපන ස්ථානයක් බවට පරිවර්තනය විය. මෙම මුල්කාලීන ආගමික අධ්‍යාපන ස්ථානයන්හි (පිරිවෙන්හි) ප්‍රධානම විෂය ධාරාව වූයේ පාලි භාෂාව හා බුදු දහමයි. මෙම අධ්‍යයන හා අධ්‍යාපන ක්‍රමවේදයන් ඉතාමත් ඵලදායී වු අතර ඒවා සිංහල අට්ඨකථා වල ප්‍රභවයටත්, ධර්මප්‍රචාරණයටත් ඉවහල් විය. කාලයාගේ ඇවෑමෙන් පාරිසරික වෙනස්වීමත් සමගම මෙම ක්‍රමය නවීකරණය වන්නට විය. එම නවීකරණයත් සමගම මෙම අධ්‍යයන හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ශ්‍රේණි ගත ක්‍රමයක් බිහිවිය. එමගින් ශාස්ත්‍රධාරියා හැදෑරු විෂයක්ෂේත්‍රයට අනුව ඔහුට යම් උසස් තත්වයක් පිරිනැමුණි. මේ නිසා ශ්‍රී ලාංකේය පාලි හා බෞද්ධ අධ්‍යාපන

ක්ෂේත්‍රය තුළ ක්‍රමානුකූල බවක් ඇති විය. මේ සඳහා උදාහරණ සපයන වල්පොල රාහුල හිමියෝ විනය අටුවාවෙන් මෙසේ කරුණු ඉදිරිපත් කළහ.[2]

> ''සමන්තපාසාදිකා විනය අටුවාවට අනුව ශ්‍රේණිගත කිරීම් නැතත් විය. (බහුස්සුතො නාම තිවිධො) මෙම ත්‍රිත්වය ප්‍රාරම්භ, මධ්‍යම, හා අවසාන වශයෙන් පෙනෙන අතර ඒවාට අදාල විෂය ධාරාවන් ද ලේඛන ගත කෙරුණු බව පෙනේ.''

සමන්තපාසාදිකාව මෙම ශ්‍රේණීන් හා ඒවාට අදාල පාඨමාලාවන් විස්තර කරයි. මෙම වාර්තාවට අනුව මෙම යුගය වන විට, ආරාමික අධ්‍යාපන ක්‍රමය තුළ (පිරිවෙණ තුළ) ක්‍රමබද්ධ වූ ඉතා පැහැදිලිව වෙන්වුණු පාඨමාලාවන් තිබුණු බව ප්‍රකටවේ. සංස්කෘත භාෂාව හඳුන්වාදීමත් සමගම මෙම ක්‍රමය තවදුරටත් ප්‍රතිසංස්කරණය වූ බව පෙනේ. සංස්කෘත භාෂා වෛපුල්‍යතාව ඉතාමත් පෘථුල අධ්‍යයන ක්ෂේත්‍රයන්ට මං පෙත් විවර කළ අතර ඒවා වැඩිපුරම ගිහියන්ට අදාල විෂයයන් වශයෙන් සැලකුණි. ඒවා අතර ඡන්දස් ශාස්ත්‍රය, ජ්‍යොතිෂය, හස්තරේඛා ශාස්ත්‍රය, වෛද්‍ය විද්‍යාව, වාස්තු විද්‍යාව, හා මූර්ති කලාව යනාදිය වේ. අනුරාධපුර යුගයේ මුල් අවධියේම පාහේ මහාවිහාර, අභයගිරි හා ජේතවන යන ප්‍රධාන ආරාමයන් හා ඒවාට අනුබද්ධිත ලක්දිව පුරා පැවැතුණු සෙසු විද්‍යාස්ථාන වල මෙම විෂයයන් ඉගැන්වුණි. මේ අනුව පාලි හා බෞද්ධ අධ්‍යයන වලට පමණක් සීමා වී තිබුණු විෂයධාරාව ගිහියන්ට අදාල වෙනත් විෂය ක්ෂේත්‍රයන්ට ද විස්තාරණය වූ බව පෙන්වා දිය හැකිය. මෙම තත්වයෙන් පාලි හා බෞද්ධ අධ්‍යයන වලට උග්‍ර බලපෑමක් සිදු නොවූයේ පාලි සංස්කෘත භාෂාද්වයේ සාම්‍යය නිසාවෙන් බව කල්පනා කළ හැකිය. සත්‍ය ලෙසම සංස්කෘත භාෂා ප්‍රාගුණ්‍ය සංස්කෘතමය (සංස්කෘතකරණය වූ) පාලි භාෂාවක් බිහිවීමට හේතුවිය. මෙම පාඨමාලා විස්තෘතත්වය මෙම ආරාමික අධ්‍යාපන ආයතනවල (පිරිවෙන්) ඉගෙනීම ලැබීමට ගිහි ශිෂ්‍යයන් ද ආකර්ෂණය කරගත් බව පෙනේ. එබඳු ප්‍රකට ශාස්ත්‍රඥයන් වශයෙන් දීඝකාරායන හා කපිල යන පඬිවරුන් දෙදෙන සඳහන් කළ හැකිය. ඔවුන් දැක්වූ පාණ්ඩිත්‍යය හා ඒ ඒ විෂයයන්හි විශේෂඥභාවය නිසා රාජකීය පිළිගැනීමක් ද විය.[3]

ඉතා දීර්ඝ ඉතිහාසයක් ඇති ශ්‍රී ලාංකේය බෞද්ධ ආරාමික අධ්‍යාපනය කාලයෙන් කාලයට උඩු යටිකුරු වෙමින් විවිධ වෙනස්කම් වලට භාජනය විය. සමහර කාල වල එය පහනක දීප්තිමත් දැල්ලක් මෙන් ආලෝකමත්ව බැබලුණු අතර තවත් කාලෙක එය විනාශ අභිමුඛයේ අන්ධකාරව පැවතුණි. රටෙහි පැවැති දේශපාලන නොසන්සුන්තා නිසා ආරාමික අධ්‍යාපනයට රාජ්‍ය අනුග්‍රහය නොලැබීම මෙම අධ්‍යාපන ක්‍රමයේ අන්ධකාර යුගයන් ඇති වීමට හේතුවිය. කෙසේවුවත්, එබඳු බාධා උපද්‍රව මැඩගෙන, සම්පූර්ණයෙන්ම අස්තයට නොගොස්, ඉදිරියට යෑමට පාලි භාෂා අධ්‍යයන වලට හැකියාව ලැබුණි. ඊට ප්‍රධානතම හේතුව වශයෙන් මෙම ආරාමික අධ්‍යාපන ක්‍රමය තුළ පැවතුණු නෛසර්ගික ශක්තියත්, භික්ෂූන්ගේ අප්‍රතිහත කැපකරීමත් දැක්විය හැකිය. අතිමහත් පාලි සාහිත්‍යයක් ශ්‍රී ලංකාවට උරුම වී තිබීම මෙම ආරාමික අධ්‍යාපන ක්‍රමයේ සාර්ථකත්වය හා භික්ෂූන්ගේ කැපවීමට සාක්ෂි දරන බව පෙන්වා දිය හැකිය.[4]

මෙම ආරාමික අධ්‍යාපන ක්‍රමය කොතරම් ශක්තිමත් මෙන්ම පාලි භාෂා අධ්‍යයන කෙරෙහි විශේෂයෙන් භික්ෂූන් තුළ පැවැති දැඩි උනන්දුව කොපමණ ද කිවහොත් සියවස් හතරක පමණ කාලයක් පැවැති යටත් විජිත පාලන යුගයේ අප්‍රමාණ පහර කෑම් වලට හසු වුවත් පාලි භාෂාව

අධ්‍යයන සම්පූර්ණයෙන්ම අභාවයට නොගියේය. සමහර පාලකයන්ගේ දුරදක්නා ආකල්පය හා භික්ෂූන් තුළ පැවැති ප්‍රශංසනීය කැපවීම නිසා පාලි භාෂා අධ්‍යයන ජීවමනාව තබාගත් අතර එය නැවතත් පැරණි උනන්දුව හා සක්‍රියත්වය ක්‍රමයෙන් ලබා ගත්තේය.

වැලිවිට සරණංකර සංඝරාජයන් වහන්සේ විසින් (ක්‍රි.ව. 1698-1778) ඇති කරන ලද බෞද්ධ පුනරුදය 19 වන සියවසට පැතිරී ගියේය. මෙම යුගයේ පාලි භාෂා ශාස්ත්‍ර අධ්‍යාපනය නගා සිටුවීමට එලෙසම සටන් වැදුණු ධෛර්ය සම්පන්න භික්ෂූන් වශයෙන් රත්මලාන පරමධම්ම චෛතිය පරිවෙණ පිහිටුවා වදාළ වලානේ සිද්ධාර්ථ පරම ධම්මචේතිය පිරිවෙණෙ ආදි ශිෂ්‍යයන් වූ හික්කඩුවේ ශ්‍රී සුමංගල, රත්මලානේ ධර්මාලෝක හිමිවරුන් දැක්විය හැකිය. උන්වහන්සේලා විසින් පිහිටුවන ලද විද්‍යෝදය (1873) හා විද්‍යාලංකාර (1875) පිරිවෙන් දෙකින් පාලි භාෂා අධ්‍යයන නගා සිටුවීමට ඉමහත් සේවයක් සිදුවිය. මෙරටට පැමිණි පාලි හා බෞද්ධ අධ්‍යයන පිළිබඳ විශේෂඥයන් වූ සමහර බ්‍රිතාන්‍ය පරිපාලන සේවකයන් මුලින් අධ්‍යාපනය ලබාගෙන තිබෙන්නේ මෙම යුගයේ ඇතැම් විශාරද භික්ෂු පඬිවරයන්ගෙනි.[5]

ඉහත සඳහන් කළ, පරම ධම්මචෙතිය විද්‍යෝදය හා විද්‍යාලංකාර යන පිරිවෙන් තුන සාම්ප්‍රදායික බෞද්ධ ආරාමික අධ්‍යාපන ක්‍රමය පෝෂණය කිරීම උරුම කරගත්තේය. මෙම නව පිරිවෙන් කාලීනව අවශ්‍යතා අනුව වෙනස්කම් සිදුකරමින් පාලි භාෂා සාම්ප්‍රදායික පාලි අධ්‍යයන ක්‍රමය තවදුරටත් ඉදිරියට ගෙන ගියේය. එහි දී කටපාඩමින් ඉගෙන ගැනීම, ව්‍යාකරණ න්‍යායන් මතක තබා ගැනීම, හා අටුවා ටීකා සමග පාලි ත්‍රිපිටක ග්‍රන්ථ විස්තරාර්ථව කියවීම යනාදියට මුල්තැන් දුන්නේය. එසේම ශිෂ්‍යයන් තුළ පාලි ගද්‍ය පද්‍ය රචනය හා කථනය පිළිබඳ මනා පරිචයක් ලබා දීමට ද මුල් තැන් දුන්නේය. මේ සියල්ලටම වඩා සාම්ප්‍රදායික පැරණි අධ්‍යාපන ක්‍රමයේ පැවැති විශිෂ්ඨත්වය නම් ඉගෙනීම හුදෙක් දැනුම සඳහා වූ ආශාව නිසාම සිදුවීමය. මෙසේ, විසිවන සියවසේ උදාවත් සමගම පාලි භාෂා අධ්‍යයනය ඉමහත් දීප්තියකට පත් වූ අතර ඒවා අධ්‍යයනය කළ ප්‍රතිභාසම්පන්න පඬිවරුන්, දේශීයවත් විදේශියවත් මහත් ගෞරවාදරයට පාත්‍ර විය. විශේෂයෙන්ම බටහිර ප්‍රාචීන ශාස්ත්‍රඥයන් තුළ ක්‍රමානුකූලව මේ සඳහා උනන්දුවක් ඇති කළේය.

මෙබඳු පසුබිමක් යටතේ ශ්‍රී ලංකාවේ පරිපාලන සේවයට පැමිණි බ්‍රිතාන්‍යයන් තම වෘත්තියේ දී මුහුණ පෑමට සිදු වූ සමහර භික්ෂූන් සම්බන්ධ ගැටලු නිරාකරණය කර තම සේවය නිවැරදිව ඉටු කිරීමට පාලි භාෂා ඥානය අවශ්‍ය වූ බැවින් හා ඒ සඳහා ඇති වූ උනන්දුව පුදුමයට කාරණයක් නොවේ. මෙම අරමුණ ඇතුව පාලි භාෂාව ඉගෙනීම ආරම්භ කළ මෙම උගතුන් ඒ තුළ ඉතාමත් පිරිපුන් ගැඹුරු දාර්ශනික චින්තන සම්ප්‍රදායයක් අන්තර්ගත වී ඇති බව අවබෝධ කර ගැනීමෙන් මහත් උද්‍යෝගයෙන් පාලි භාෂාව හැදෑරීමට යොමු වූහ. එබඳු විදේශීය පඬිවරුන් වශයෙන් චිල්ඩර්ස්, චාමර්ස්, රිස් ඩේවිඩ්ස්, යනාදීන් සඳහන් කළ හැකිය.

**ප්‍රාචීන භාෂෝපකාර සමාගම ශ්‍රී ලංකාවේ පිහිටු වීම.**

ඉහත දැක් වූ බටහිර ජාතින්ගේ පාලි භාෂා අධ්‍යයන පිළිබඳ ඇති වූ උනන්දුව 1902 ජුලි 24 වෙනි දින ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම පිහිටු වීමට ඉවහල් විය. ඒ පිළිබඳ අදහස් දක්වන පොදු

උපදේශනය පිළිබඳ දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්‍ෂක (පසු ව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක වු) එස්. එම්. බුරෝස් මහතා මෙසේ ප්‍රකාශ කරයි.[6]

> ''රටේ විවිධ ප්‍රදේශ වල සංචාරය කළ අවස්ථාවල පිරිවෙන නම් අධ්‍යාපන අයාතනය පිළිබඳ දැනුමක් ග්‍රහනය කර ගැනීමට මට හැකියාව ලැබුණි. පාලි සංස්කෘත හා සම්භාව්‍ය සිංහල අධ්‍යාපනය සපයාදීමට මෙම ආයතන පිහිටුවා තිබෙන බව මට පෙනේ. මෙම අධ්‍යාපන ආයතන වල ඉගෙන ගන්නා අය වැඩිහිටියෝය. ස්වාර්ථ සාධනය සඳහා අවංක උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් ආරම්භ කරන ලද මෙම අධ්‍යාපන ක්‍රමය උපරිම අයුරින් පෘථුල වී තිබේ. විවිධ ආකාර වු මෙම ප්‍රාචීන උගතුන්ගේ ශාස්ත්‍රීය අධ්‍යයන එක් පාඨමාලාවක් යටතේ සකස් විය යුතු බව මම තරයේම විශ්වාස කරමි. ඒ තුළින් පූර්ව අංගයන් මූර්තිමත් වන පරිදි සකස් කර ගන්නා එබඳු තනි පාඨමාලාවක් තුළින් මෙම අධ්‍යාපන ක්‍ෂේත්‍රය තුළ ශ්‍රේෂ්ඨ අභිලාෂයක් සපුරාගත හැකි බව ද මම තරයේම විශ්වාස කරමි.''

මෙහි අන්තර්ගත සමහර නිරීක්‍ෂණයන් එතරම් පැහැදිලි නැති වුවත් (සමහර විට වැරදි සේ වාර්තා කිරීම නිසා විය හැකියි). මෙම ප්‍රාචීන අධ්‍යයන ප්‍රතිසංස්කරණය පිටු පස තිබෙන මූලික අභිප්‍රාය ඉතාමත් සාධනීය වේ. මෙහි ප්‍රධානතම අරමුණ වූයේ පැරණි අංශයන් මූර්තිමත් වන සේ පොදු පාඨමාලාවක් වෙතින් එක් ප්‍රවාහයක් තුළ එය සකස් කිරීමයි.

ඉහත පෙන්වා දුන් පරිදි ත්‍රිපිටක හා පශ්චාත් ත්‍රිපිටක ග්‍රන්ථ මෙන්ම වෙනත් බෞද්ධ කෘති පහසුවෙන් අවබෝධ කර ගැනීමට අවශ්‍ය වු භාෂාඥානයේ විශාරදත්වයක් ලබා දීමේ චේතනාවෙන් මෙම පාලි භාෂා අධ්‍යයන සීමා විරහිත ක්‍රමයකට ආරම්භ විය. ඒ තුළින් ත්‍රිපිටක හා සෙසු බෞද්ධ ග්‍රන්‍ථ කියවා තේරුම් ගැනීමට මෙන්ම නිර්මාණාත්මක හා ශාස්ත්‍රීය කෘති බිහි කිරීමට අවශ්‍ය පාලි භාෂා ප්‍රාගුණ්‍යය ද ලැබුණි. මෙම ක්‍රමය යටතේ පුහුණුව ලැබූ උගතුන් විසින් ගොඩනගන ලද පෘථුල වූත් විවිධ වූත් ශ්‍රී ලංකා පාලි සාහිත්‍යය මෙම ක්‍රමයේ ප්‍රතිඵල හා සාර්ථකත්වය මූර්තිමත් කෙරෙන විපුල සාධකය වේ. එසේම ඉහත පෙන්වා දුන් පරිදි පාලි අධ්‍යාපනයේ සාම්ප්‍රදායික ආරාමික ක්‍රමය තුළ ග්‍රන්‍ථ හා විෂය ක්‍ෂේත්‍රයේ විශාරදත්වය අනුව ශ්‍රේණිගත කිරීමක් තිබුණි. එහෙයින් එය වර්තමාන යුගයේ තේරුම් ගත් ආකාරයට තනි ප්‍රවාහයක් තුළ නිර්මාණය වී නොතිබිණි. සමහරවිට පාලි භාෂා අධ්‍යයනයේ පැවැති සීමා බන්ධන විරහිතභාවය එම ක්‍රමය ශක්තිමත් කිරීමට ඉවහල් වූවා විය හැකිය.

එක් පාඨමාලාවක් නිර්මාණය කොට ඒ හා බැඳුණු විභාග ක්‍රමයක් තුළ එක් ප්‍රවාහයකට අනුයුක්ත කෙරුණු මෙම ක්‍රමය පාලි භාෂා අධ්‍යයන තුළ නව ප්‍රවණතාවක් බිහි කිරීමට හේතු වන්නට ඇත. එසේම එය අධ්‍යයන ක්‍ෂේත්‍රයට අදාළ විෂය පථයේ සැලකිය යුතු සීමාකරණයකට ද හසු විය. මෙම නව යෝජනා ක්‍රමය යටතේ ද ප්‍රාරම්භ, මධ්‍යම, හා අවසාන යන ශ්‍රේණිගත ක්‍රමය අනුගමනය කෙරුණි. පොදු පාඨමාලාවක් පිළිගැනීම තුළ මෙම අධ්‍යයන විෂය ක්‍ෂේත්‍රය පැහැදිලිවම පටුවිය. ඒ තුළ වඩාත් අවධාරණය කෙරුණේ දැනුම ලබා ගැනීමට වඩා විභාග සමත් වීමයි.

කෙසේ නමුත් මෙම අවධාරණයේ සීමා වීම හා ලසුවීම මෙම නව ක්‍රමය ආරම්භයේ දී ප්‍රකට වූයේ නැත. ඊට හේතුව මෙම නව ක්‍රමය පැරණි ක්‍රමය තුළ යම් යම් කැළල් ඇති කලත් එය සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප නොකළේය. පැරණි ක්‍රමය තුළ පැවතුණු කටපාඩම් ක්‍රමය, ව්‍යාකරණ, ගැටලු විසඳීම සඳහා ව්‍යාකරණ සිද්ධාන්ත ප්‍රායෝගිකව යෙදීම, ගද්‍ය පද්‍ය රචනය, ත්‍රිපිටක හා අටුවා සාහිත්‍යය අධ්‍යයනය යනාදිය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කෙරුණේ නැත. එසේම මෙම නව යුගයේ මුල් කාලීන ශාස්ත්‍රාභිලාෂියෝ ප්‍රාචීන විභාගයන්ට පෙනී සිටියේ පාඨමාලාවක් තුළ සීමා නොවුණු, පූර්ව සම්ප්‍රදායට අයත් විශේෂඥ පඬිවරුන් යටතේ අධ්‍යයන වල යෙදීමෙනි. එහෙයින් තනි පොදු පාඨමාලාවක් තිබුණත් මෙම නවයුගයේ ආරම්භක ශාස්ත්‍රධරයෝ ඊට කොටු නොවී මනා දැනුම් සම්භාරයකින් සමන්විත වූහ. මෙම කොටස් තුනකින් යුත් ප්‍රාචීන විභාග ක්‍රමයේ මුල් කොටස වූ ප්‍රාචීන ප්‍රාරම්භය 1903 වසරේ දී ආරම්භ වූ අතර සෙසු කොටස් වන මධ්‍යම හා අවසාන විභාග දෙක පිළිවෙලින් 1905, 1909 යන වසර වල ආරම්භ විය. වාර්තාවන්ට අනුව මෑතකාලීන කිර්තිමත් පාලි උගතෙක් වූ විදුරුපොල පියතිස්ස නාහිමියෝ රත්මලානේ පරම ධම්මචේතිය පිරිවෙණින් අධ්‍යාපනය ලැබ ප්‍රථමයෙන්ම ප්‍රාචීන පණ්ඩිතෝපාධිය ලැබූහ. මුල්ම ගිහි පණ්ඩිතෝපාධිධාරියා ජී. පී. වික්‍රමාරච්චි මහතාය. (1913). පසුව යක්කල සිද්ධායුවේදායතනය එතුමා විසින් ආරම්භ කරන ලදි.[7] මෙම පණ්ඩිතෝපාධිධාරීන්ගෙන් වැඩි ප්‍රතිශතය වූයේ භික්ෂූන් වහන්සේලා වූ අතර ඉන් බොහෝමයක් විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් දෙකින් බිහිවූහ. ඊට අමතරව රට පුරා විහිදී තිබුණු අනෙකුත් පිරිවෙන් වලින් ද සාර්ථක ශාස්ත්‍රඥයෝ ප්‍රමාණයක් බිහි වූහ.

විසිවන සියවසේ මුල් දශක කිපය තුළ මෙම ප්‍රාචීන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර සකස් කිරීම හා ඒවා ප්‍රමිත කිරීම ඉතාමත් උසස් මට්ටමකින් පැවතුණි. එකල සාර්ථකව ප්‍රාචීන අවසාන උපාධිය නිම කළ ශිෂ්‍යයාට ගැඹුරු ඥානයක් හා මනා පාලි භාෂා පරිචයක් ලැබුණි. ඊට විෂයධාරාවක් නියම කිරීමෙන් යම් යම් සීමා බාධක තිබුණත්, ඒවා ඉක්මවා ගොස් ආවශ්‍යක විෂය දැනුම ග්‍රහණය කෙරුණි. මේ සඳහා හොඳම සාක්ෂිය නම් මුල් කාලීන ප්‍රාචීන පණ්ඩිතයන් විසින් පාලි සාහිත්‍යයට කරන ලද මහඟු සේවයයි. එහෙත් විසිවන සියවසේ අවසාන දශක තුළ මෙම තත්වය ක්‍රමයෙන් පරිහානියට පත් වූ බව පෙනේ. මේ සඳහා බලපෑ හේතු සාධක රාශියක් තිබිය හැකි අතර ඒවායෙන් සමහරක් පමණක් මෙම ලිපියේ දී අවධානය යොමු කෙරේ.

### විශ්වවිද්‍යාල පාලි අධ්‍යයන [8]

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල විෂය ධාරාවට ප්‍රාචින භාෂා අධ්‍යයන එකතු කිරීම මෑතකාලීන පාලි භාෂා අධ්‍යාපනයන්හි සිදු වූ තවත් එක් වන ප්‍රවණතාවක් වශයෙන් පෙන්වාදිය හැකිය. මේ සඳහා ආරම්භක පියවර තබන ලද්දේ ශ්‍රී ලංකාවේ එවකට බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයාව සිටි සර් හෙන්රි මැකලම් විසිනි. (1907-1913) මෙම ආරම්භය අනුව යමින් ආණ්ඩුකාර රොබට් චාර්මර්ස් ඉතා ශක්තිමත් යෝජනාවලියක් ඉදිරිපත් කළා පමණක් නොව තමන් ද කීර්තිමත් පාලි භාෂා ශාස්ත්‍රඥයෙක් බවට පත් විය. (1913-1916). පාලි සංස්කෘත හා සිංහල යන භාෂාත්‍රය විශ්වවිද්‍යාල වල ඉගැන්වීමට කථිකාචාර්යවරුන් බඳවා ගැනීම එවකට (1920) අධ්‍යාපන අධ්‍යක්ෂකවරයාව සිටි ඊ. බී. ඩෙන්හාම් මහතා විසින් අනුමත කිරීමෙන් තත්වය තවදුරටත් යහපත් විය. මෙම යෝජනාවලිය ඉදිරිපත් කරමින් ඔහු එවකට වසර දෙකක ශිෂ්‍යත්වයක් ලැබූ ඔක්ස්පර්ඩ් විශ්වවිද්‍යායේ මැන්චෙස්ටර් කොලිජියෙහි

ඉගෙනුම ලබමින් සිටි සූරියගොඩ සුමංගල හිමියන්ගේ නම යෝජනා කළ අතර සාර්ථක වූයේ 1922 දීය.

ඩෙන්හැම් මහතාගේ සමහර නිරීක්ෂණයන් සඳහන් කිරීම ඉතාමත් වැදගත් විය. එතුමා විශ්වවිද්‍යාල කොලීජියේ කාර්යශූර ආචාර්ය මණ්ඩලයේ සාර්ථකත්වය නිවැරදිව නිරීක්ෂණය කොට යටත් විජිත ලේකම්වරයාගේ අවධානය දිනා ගත්තේය. එතුමා එංගලන්තයේ මහාචාර්යවරුන් අනුයුක්ත කිරීමත් අතිරේක වශයෙන් ඉන්දියාවෙන් හෝ ලංකාවෙන් ගණිත මහාචාර්යවරයෙක් අනුයුක්ත කිරීමත් සමග අවශ්‍ය බවට යෝජනා කරයි. එම මහාචාර්යවරුන් ඔක්ස්පර්ඩ් හෝ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාල වලින් උපාධිලත් විභව ශක්තියක් අත්තන් විය යුතු බවට ද තව දුරටත් යෝජනා කරයි. මේ අනුව යටත් විජිත පාලකයන් මෙම ප්‍රාචින භාෂා අධ්‍යාපන ක්‍රමය හඳුන්වා දීමට ඉමහත් වෙහෙසක් ගත් බව පෙනේ. එසේම ඒවා ඒ වන විටත් ඔක්ස්පර්ඩ්, කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලවල පවා පිළිගෙන තිබුණි. ප්‍රාචින ක්‍රමය හඳුන්වාදීමේ දී සාම්ප්‍රදායික ආරාමික අධ්‍යාපන ක්‍රමයේ කිසිම අංගයක භාවිතය පිළිබඳ කිසිවක් සඳහන් නොවේ. විශ්වවිද්‍යාල කොලිජියේ මාධ්‍යය ඉංග්‍රිසි නිසා එය පිරිවෙණ තුළ අධ්‍යාපනය ලැබූ ඉංග්‍රිසි නිපුනතාව මද භික්ෂූන් වහන්සේලාගේ ප්‍රවේශයට බොහෝ සෙයින් ම බලපෑවේය.

විශ්වවිද්‍යාලය තුළ පාලි අධ්‍යයනය මානව ශාස්ත්‍ර අධ්‍යයන නම් වූ පුළුල් පරාසයක විෂයයක් වශයෙන් සැලකූ අතර එය සෙසු විෂයයන්ගෙන් අනන්‍ය නොවීය. මේ විශවවිද්‍යාල ක්‍රමයේ මූලික පරමාර්ථය වූයේ දිවයිනේ යටත්විජිත පරිපාලනයට උදව් කිරීම සඳහා සම්පත් දායකයන් වශයෙන් උපාධිධාරින් පුරුදු පුහුණු කිරීමය. ප්‍රාචීන භාෂාවන්හි නිපුනතාවක් ඇති ඉංග්‍රීසි මාධ්‍යයෙන් වැඩ කළ හැකි උපාධිධාරින් පිරිසක් නිර්මාණය කර ගැනීමට යටත් විජිත බලධාරින් කල්පනා කිරීම ඉතාමත් නිවැරදිය. ඊට හේතුව ඔවුහු දේශීය සංස්කෘතිය, චාරිත්‍රවාරිත්‍ර හා ජනතා සිතුම් පැතුම් ගැන මනා අවබෝධයක් ඇත්තෝ වීමයි. විවේචනාත්මක රචනය, වර්ණනාත්මක ලේඛනය, සාරාංශකරණය, මතභේදාත්මක ප්‍රශ්න පිළිබඳ නිරාකරණය, හා ඒවා තාර්කික හා ක්‍රමික පදනමකින් විග්‍රහා කිරීම යනාදි පරිපාලන සේවයට ඉතාමත් ප්‍රයෝජනවත් ප්‍රාගුනායන්ය. ඊට හේතුව පරිපාලන සේවයට අවශ්‍ය වාර්තා තැබීම, ප්‍රශ්න සාරාංශකරණය, සටහන් ගැනීම, යනාදියට නිපුන පුද්ගලයෝය. විශ්වවිද්‍යාලවල පාලි අධ්‍යාපනය ප්‍රධාන වශයෙන්ම කේන්ද්‍රගත කෙරුණේ පාලි භාෂා කුශලතාවන් වර්ධනය කිරීමට වඩා ඉහත දක්වූ පරිපාලන කාර්යයන් සාර්ථක කර ගැනීමටය. එසේම පාලි භාෂා අධ්‍යයන වල මූලික අරමුණ වූයේ සමහර ත්‍රිපිටක ග්‍රන්ථ තේරුම් ගැනීම, හා අදාල විෂය පථය හැදෑරීම පමණි. මේ තත්ත්වය ආරාමික අධ්‍යාපන රටාව හා සසඳනවිට ඉතාමත් පටුය. ආරම්භයේ දී විශ්වවිද්‍යාලවල පාලි භාෂා අධ්‍යයන සඳහා එතරම් ඉල්ලුමක් නොතිබුණි. ඊට හේතුව ප්‍රාචීන භාෂා අධ්‍යයන සිදුවූයේ සිංහල භාෂා මාධ්‍යයෙනි. එමනිසා ඉහළ රැකියාවන් සඳහා එය හේතු නොවුණු අතර පාසල් අධ්‍යාපන මට්ටමෙන් ද ඒ සඳහා ඉල්ලුමක් නොතිබුණි. එමනිසා විශ්වවිද්‍යාලවල එතරම් ශිෂ්‍යය සංඛ්‍යාවක් මේ විෂයයන් අධ්‍යයනය නොකළහ. විශ්වවිද්‍යාල ප්‍රාචීන අධ්‍යාපනයේ ඉතාමත් ප්‍රමුඛයෙක් වූ ජී. පී. මලලසේකර මහාචාර්යවරයා මේ තත්ත්වය වෙනස් කරමින් ඊට ආලෝකයක් වූයේය. 1930-1931 වර්ෂවල ප්‍රාචීන භාෂාවන් හැදෑරූ ශාස්ත්‍රඥයන්ගේ විශ්වවිද්‍යාල ප්‍රවේශය ගවේෂණය කළ එතුමා ඒ සම්බන්ධව මෙසේ ප්‍රකාශ කරයි.

> ''නිසැක වශයෙන්ම මීට හේතුව මේ දිවයිනේ විශාල ප්‍රමාණයක් තිබෙන ද්විතියික පාසල් වල උසස් පන්තිවල මෙම විෂයයන් (ප්‍රාචින භාෂා

> විෂයයන්) හැදෑරීමට අවසර ලැබෙන සේ සුදුසු පරිදි ඒවා සකස් නොවීමයි''[9]

මේ තත්ත්වය වෙනස් කිරීම සඳහා එතුමන්ගේ යෝජනාව වූයේ රාජ්‍ය පරිපාලන සේවයේ විභාගයට (CSA) පාලි භාෂාව ද ඇතුළත් කළ යුතු බවයි. එතුමාගේ මෙම උත්සාහය මුලින් අසාර්ථක වුවත් පසුව ඒ සඳහා කෙරුණු බලවත් ඉල්ලීම මත 1935-1936 වර්ෂ වල පරිපාලන විභාගයට ඉතිහාසයේ මුල්වරට පාලි භාෂාව ද අන්තර්ගත කෙරුණි. එතුමා ඉතාමත් නිවැරදිව අපේක්ෂා කළේ ඒ තුළින් දෙමව්පියන්ගේ හා බලධාරින්ගේ අවධානය පාලි භාෂා අධ්‍යයන කෙරෙහි යොමු කරවීමය. එය ඉතාමත් සාර්ථක පියවරක් වු බව ප්‍රකාශ කළ හැක්කේ ඉන්පසු විශ්වවිද්‍යාලවල ප්‍රාචීන භාෂා ඉගෙනීම ඉතාමත් ජනප්‍රිය වීම නිසායි. ඒන්. ඒ. ජයවික්‍රම මහාචාර්යතුමා අනුගමනය කරමින් රත්නා හදුරුකන්ද මහාචාර්යතුමිය මෙසේ ප්‍රකාශ කරන්නීය.[10]

> ''ඉන්දු ආර්ය උපාධිය හැදෑරු ශිෂ්‍යයන්ට උසස් පරිපාලන විභාගය සඳහා පෙනී සිටීමට මං විවරවීම අපේක්ෂිත ඵලයයි. ඉන්දු ආර්ය දෙපාර්තමේන්තු වලින් උපාධි ලැබ විවෘත තරගයකින් පසු පරිපාලන සේවයට බැඳුණු ශිෂ්‍යයෝ අන් දෙපාර්තමේන්තු වලින් උපාධි ලද්දන් හා සමානව ඉතාමත් ගෞරවාන්විතව විධායක ශ්‍රේණියේ සේවය කළෝය. මෙම ශිෂ්‍යයන් පරිපාලන වෘත්තියේදී දැක්වූ සාර්ථකත්වයට හා ඔවුන්ගේ අසාමාන්‍ය හැකියාවන්ට හේතුව ඒ අය බටහිර අධ්‍යාපන ක්‍රමය යටතේ ඉගෙන ගත් ශිෂ්‍යයන්ට වඩා පොදු ජනතාවගේ ප්‍රශ්න වලට මුහුණ දිය හැකි මනා දැනුමකින් හා පසුබිමකින් පරිපෝෂණය වීමයි. මේ තත්වය විශ්වවිද්‍යාලයන්හි ප්‍රාචීන භාෂා දෙපාර්තමේන්තු වල ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය වීමට හේතු විය.''

ප්‍රාචීන භාෂා අධ්‍යයන වලට ශිෂ්‍යයන් හඹා යෑම වැඩිවීම සතුටට මෙන්ම උද්යෝගයට හේතුවක් වුවත්, එමගින් පාලි භාෂාවට සිදු වූ සේවය කුමක්ද? , අවසාන උපාධිය ඉහළින් සමත් ශිෂ්‍යයන් කී දෙනෙකුට එම දැනුම දියුණු කරමින් ඉදිරියට ගමන් කළ හැකි වූයේද? , යන්න විමසා බැලිය යුතුය. සමහර ශිෂ්‍යයෝ කීර්තිමත් පරිපාලන සේවයට ගමන් කළ අතර අන් අය පරිපාලන සේවයේ තරමක් පහල තරාතිරමේ සේවයන් කළහ. ඔවුන්ගෙන් තවත් සමහරෙක් අයබදු දෙපාර්තමේන්තුවට අනුයුක්ත වූහ.

මෙහිදී ඉතාමත් පැහැදිලි කාරණය නම් ඉංග්‍රීසි මාධ්‍ය විශ්වවිද්‍යාල පාලි භාෂා උපාධිය ඉතා නම්බුකාර රැකියාවක් ලැබීම තහවුරු කෙරෙන්නක් වී තිබීම අඩු තරමින් පාසල් ගුරු පත්වීමක්ද ලැබීම අනිවාර්යය එම උපාධියට මූල්‍යමය වයිනාකමක් තිබුණි. බොහෝ පාලි උපාධිධාරීහු මෙබඳු නම්බුකාර රැකියාවකින් තම ජීවිත පැවැත්ම සුරක්ෂිත වූ විට පාලි භාෂාව තවදුරටත් හැදෑරීමට කල්පනා නොකළහ.

මෙහිදී සිදු වු සත්‍ය නම්, ඔවුන් පාලි හා කිසිම සම්බන්ධයක් නැති රැකියාවන්ට බැඳුනු පසු සම්පූර්ණයෙන්ම පාලි භාෂාව නොසළකා හැර එය අමතක කිරීමය. විශ්වවිද්‍යාල වල අධ්‍යයන සේවයට තෝරාගත් ඉතාමත් සුළු පිරිසක් පමණක් මෙම පාලි භාෂා අධ්‍යයනය දිගටම කරගෙන ගියහ. ඒ අය අතර පවා අතලොස්සක් පමණක් වාග් විද්‍යාත්මකව ගැඹුරින් පාලි භාෂා අධ්‍යයනය කළහ. මේ සඳහා පෙන්විය හැකි හොඳම නිදර්ශනය නම් මෙම විද්වතුන් විසින් කරන ලද පශ්චාත් උපාධි පර්යේෂනයන්ය.[11]

විශ්වවිද්‍යාල පාලි භාෂා අධ්‍යයන හුදෙක් ත්‍රිපිටක හා සෙසු ග්‍රන්ථ කියවා තේරුම් ගැනීමට පමණක් සීමාවීම පාලි භාෂා අධ්‍යයනයේ පරිහානියට හේතු වන්නට ඇත. ඒවායෙහි වැඩි අවධානය යොමු වූයේ නූතන විද්‍යාත්මක ක්‍රමවේදයන්, විවේචනාත්මක ඇගයීම, තුලනාත්මක ගවේෂණ යනාදී පැතිකඩ වලටය. මෙම සියලුම ආකල්ප හා ඉගෙන්වීම් ක්‍රම ඔක්ස්පර්ඩ් හා කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාල වල අනුගමනය කෙරුණු ක්‍රමවේදයන්ය. එබඳු පුහුණුවක් යටතේ සමහර දීප්තිමත් ශිෂ්‍යයන් බිහිවූ අතර ඔවුහු ශ්‍රී ලංකාවට ඉමහත් ගෞරවයක් ගෙන දුන්හ. වාග් විද්‍යානුකූල අධ්‍යයන වලට එමෙන්ම අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් විශ්වවිද්‍යාල වලින් පිටවෙන උපාධිධරයන් ග්‍රන්ථ සංස්කරණය, ශබ්ද කෝෂ සම්පාදනය, අටුවා ටීකා බඳු, ග්‍රන්ථ පරිවර්තනය, යනාදි ශාස්ත්‍රීය අංශයන්ගේ දායකත්වය අල්ප විය. මුල් දශක කීපය තුළ ප්‍රාචීන උගතුන්ගෙන් සිදුවූ දායකත්වය හා සසඳා බලන විට විශ්වවිද්‍යාල උපාධිධාරීන්ගේ පාලි භාෂා වාග් විද්‍යාත්මක නිෂ්පාදන ඉතාමත් හිඟ (අල්ප) බව පැවසිය හැකිය. ප්‍රාචීන භාෂෝපකාර සමාගම විසින් පළ කරන ලද, (සිංහල) ශාස්ත්‍රීය සංග්‍රහයේ දැක්වෙන ප්‍රාචීන අවසාන උපාධිය සඳහා වූ නිබන්ධන මාතෘකා, සැළකිය යුතු සංඛ්‍යාවක පාලි ග්‍රන්ථ සංස්කරණය, ශබ්ද කෝෂ රචනයට සඳහා වූ උත්සාහයන්, හා පාලි ව්‍යාකරණමය ග්‍රන්ථ රචනය යනාදිය තුලින් පවා මේ කාරණය ප්‍රකට වේ.

මේ ප්‍රාචීන පණ්ඩිතයන් විසින් පාලි අධ්‍යයන වල අභිවර්ධනයට කරන ලද සේවය හා කැපකිරීම මූර්තිමත් කෙරෙන ප්‍රමාණවත් සාධක බොහෝය.

කෙසේ නමුත්, විසිවන සියවසේ අවසාන භාගය වන විට මෙම ප්‍රාචීන භාෂා අධ්‍යයන වලද පරිහානි ලක්ෂණ පෙන්නුම් කෙරේ. මෙම පරිහානියට එක් හේතුවක් වශයෙන් විශ්වවිද්‍යාල වල පාලි භාෂා අධ්‍යයන දියුණු වීම පෙන්වා දිය හැකිය. ඉහතින් දැක්වූ පරිදි, මුල් දශකයන්හි පාලි භාෂා අධ්‍යයන වල අරමුණ වූයේ දැනුම ග්‍රහණය කර ගැනීමයි. නමුත් ප්‍රාචීන අවසාන සමතුන්ට පිරිවෙන් වල ගුරුපත්වීම් ලබා දීමෙන් මෙම තත්වය ක්‍රමානුකූලව වෙනස් විය. මේ තත්වය විශ්වවිද්‍යාල වල ශාස්ත්‍රවේදී පාලි උපාධියට මූල්‍යමය වටිනාකමක් ලැබීමට සමාන කළ හැකි අතර මෙකී ප්‍රාචීන උගත්හු ද ගුරුපත්වීමක් ලැබ ජීවිත සුරක්ෂිතභාවය සඳහා පමණක් ප්‍රාචීන විභාග සම්පූර්ණ කළහ. ශාස්ත්‍රවේදී උපාධිධාරීන්ට සමානම වරප්‍රසාද හා පඩිනඩි ඉල්ලා උද්ඝෝෂණය කරන්නට ද වූහ. මෙම මූල්‍යමය වටිනාකම ඉස්මතු වූ විට ශාස්ත්‍රීයමය උද්‍යෝගය හීන වන්නේය. මෙම පරිහානිය අත්හිටුවීම සඳහා සමහර අවස්ථාවල බලධරයන් විසින් තදබල ලෙස ගනු ලැබූ සමහර තීන්දු තීරණ හා හඳුන්වාදුන් නව නීති රීති නිසා මෙම තත්වය තවත් අවපාතයට ගියේය. උදාහරණ වශයෙන් ප්‍රාචීන අවසානය සම්පූර්ණ කිරීමට සුළු නිබන්ධනයක් ලිවීම අනිවාර්ය කිරීම බඳු කරුණු පෙන්වා දිය හැකිය. මෙම නීතිය 1928 දී ආරම්භ කෙරුණු අතර 1952 දී එය අහෝසි කරන ලදී. මුල් යුගයේ මෙන් ප්‍රාචීන උපාධියට, ශාස්ත්‍රවේදී උපාධියට හා සමතැන් පිරිනැමීමෙන් එය තවත් අගාධයට ගියේය. විසිවන සියවසේ මුල් දශක පහේ හා පශ්චාත් දශක පහේ ප්‍රාචීන ප්‍රශ්න පත්‍ර නිරීක්ෂණය කිරීමෙන් මෙම තත්වය වටහා ගත හැකිය.

ඉගැන්වීමේ හා විභාග පැවැත්වීමේ බලය ශ්‍රීලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම සතු වීමෙන් සාම්ප්‍රදායික ආරම්භක අධ්‍යයන ක්‍රමයට හිමිව තිබූ පාලන බලය අහිමි වී ගියේය. කාලයාගේ ඇවෑමෙන් නව ප්‍රාචීන පණ්ඩිතයන් විසින් ඉගැන්වීමේ වගකීම් ලබා ගත් විට, පැරැන්නන් එය අත්හැර යෑමෙන් සාම්ප්‍රදායික ආරාමික අධ්‍යාපනය ක්‍රමයෙන් පරිහානියට පත් විය. දැනට එහි

පවතින තත්වය නම් එය  පැරණි ආරාමික සාම්ප්‍රදායට හෝ විද්‍යාත්මක නව සාම්ප්‍රදායට හෝ අයත් නොවීමයි. ඒ තුලින් ප්‍රශස්ථ පාලි උගතුන් හෝ බෞද්ධ පඬිවරුන් බිහි කිරීමට අසමත් හුදෙක් ඉගැන්වීම හා විභාග පැවැත්වීම පමණක්  සිදු කෙරෙන ක්‍රමවේදයක් බවට පත්විය.

විශ්වවිද්‍යාල පාලි අධ්‍යාපනයේ දෛවය තවදුරටත් යහපත් නොවීය. එක් කාලයකට එය විශාල ප්‍රමාණයක ගෞරවාන්විත සිවිල් පරිපාලකයන් බිහි කළේය. එසේම සැළකිය යුතු සංඛ්‍යාවක් ජාත්‍යයන්තර කීර්තියට පත් බෞද්ධ උගතුන් හා සුළු ප්‍රමාණයක පාලි උගතුන් බිහි කළේය. 1956, පනත්, නො : 33 දරණ රාජ්‍ය භාෂා පනතින් සිදු කෙරුනු වෙනස්කම් නිසා විශ්වවිද්‍යාල පාලි භාෂා අධ්‍යයනයන්ට අසතුටුදායක බලපෑම් සිදුවිය. මෙම පනතින් සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයෙන් ඉගැන්වීම නතර නොකෙරුණු අතර ඉංග්‍රීසි භාෂාව ප්‍රතික්ෂේප කරමින් එහි අන්තයට ගියේය. ගිහි පාලි භාෂා උපාධිධාරීන්ට තිබුණු ශක්තිය හුදෙක් එම අධ්‍යයන තුළින් ලද දැනුම ම නොව ඒ තුළින් ඔවුන් ලද ඉංග්‍රීසි භාෂා නිපුණතාවය ඔවුන්ට යටත් විජිත පාලකයන් සමග වැඩකිරීමටත්, ඉංග්‍රීසියෙන් කෙරුණු නව පර්යේෂණයන් හා අධ්‍යාපන ක්‍රමවේදයන් හැදෑරීමටත් ආවශ්‍යක උපකාරයක් වූ බැවිනි. සමහරවිට කෙනෙකුට එය තේරුම් ගැනීමට අපහසු විය හැකිය. ඉගෙනීමේ භාෂා මාධ්‍යය වෙනස් කිරීමත් සමඟම පාලි භාෂා උපාධිධාරීහු අන් විෂයන් හදාරා පරිපාලන සේවයට ඉල්ලුම් කළ ශිෂ්‍යයන් හා තරග කිරීමේ දී තමන්ට තිබුණු වාසිය අහිමි කර ගත්හ. එසේම ඉංග්‍රීසියෙන් පළ කෙරුණු පර්යේෂනයන් හැදෑරීම,  ඉංග්‍රීසියෙන් වැඩ කිරීමේ හැකියාව ජාත්‍යයන්තර පිලිගැන්ම හා අඩුතරමින් පිළිගත් බෞද්ධ උගතෙක් වීම යනාදී අවස්ථා ද ඔවුන්ට ගිලිහී ගියේය.

මීට දශක තුන හතරකට පෙර ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලීය ආචාර්යවරයෙකුගේ වැටුපෙන් එංගලන්තයේ ඔක්ස්පර්ඩ්, කේම්බ්‍රිජ්, ලන්ඩන් වැනි විශ්වවිද්‍යාලයක පශ්චාත් උපාධියක් හැදෑරීමට ප්‍රමාණවත් විය. ඒ අනුව ශිෂ්‍යත්වයක් නොලැබ එංගලන්තයේ පශ්චාත් උපාධි හැදෑරූ මෙරට ආචාර්යවරු බොහෝ සොයා ගත හැකිය. අද එම තත්වය හාත්පසින්ම වෙනස්ය. වර්තමානයේ ශ්‍රී ලංකාව හා යුරෝපීය රටවල් පවත්නා ආර්ථික විශමතාවය එක් අන්දමකින් මෙම පරිහානියට බලපෑ ඇති බව පෙන්වා දිය හැකිය.

සියලුම විෂයයන් ජාතික භාෂාවන්ගෙන් (සිංහල හා දෙමළ) ඉගෙනීමේ පසුබිමක් තුළ සියලුම උපාධින්ට තිබුනු මූල්‍යමය හා වෙළඳ වටිනාකමද ලොප් වූයේය. එම නිසා පාලි භාෂා අධ්‍යයනයන්ට ඉතා සුළු ශිෂ්‍ය සංඛ්‍යාවක් ප්‍රවේශ වීම පුදුමයට කරුණක් නොවේ. ඔවුන් සමහරක් වෙනත් විෂයයන් හදාරන අය වන අතර තවත් සමහරක් විදේශීය ශිෂ්‍යයෝය. මේ අයට තෘප්තිමත් වන පරිදි ඉගැන්විය හැකි ප්‍රමාණවත් ආචාර්යවරුන් නොමැති වීම ගැන ඔවුහු මැසිවිලි නගති. මීට හේතුව විශේෂයෙන්ම සාම්ප්‍රදායික ආරාමික අධ්‍යාපනයේ හා විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්‍රමයේ ආභාෂයෙන් බිහිවුණු මනා ඉංග්‍රීසි භාෂාමය නිපුණතාවයක් ඇති ගුරුවරුන්ගේ හිඟයයි.

එමනිසා වර්තමානයේ පැන නැගී ඇති මෙම නව ප්‍රවණතා ද්වය පිළිබඳව සෘජුවම හා ක්ෂණිකව ගැඹුරින් අධ්‍යයනය කොට , ප්‍රායෝගික හා ප්‍රතිකර්මය වූ පියවර ගත යුතුය. මෙය වහාම කළ යුත්තක් සේ අවධාරණය කිරීමට සිදුවන්නේ පාලි භාෂා ශාස්ත්‍රීයත්වය ශ්‍රීලංකාවේ අන්තර්ධාන වෙමින් පවතින ප්‍රාචීන ශාස්ත්‍ර නාම ලේඛනයේ ඉහලින්ම සනිටුහන් වී තිබීම නිසයි.

<u>**ආන්තික සටහන්**</u>

1. මෙම අටුවා මුලින් පාලි භාෂාවෙන් තිබුණු අතර එය ආර්ය මහින්ද හිමියන් විසින් ශ්‍රී ලංකාවට ගෙන එන ලදී.
2. වැලිපොළ රාහුල හිමි, *ලක්දිව බුදුසමයෙහි ඉතිහාසය*, 307හි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 11, 1962
3. වැලිපොළ රාහුල හිමි, *ලක්දිව බුදුසමයෙහි ඉතිහාසය*, 307හි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 11, 1962
4. G.G.P.Malalasekara, *Pali Literature of Ceylon*, London, 1928
5. පාලි ඉංග්‍රීසි ශබ්ද කෝෂයේ කතෘ (*Pali-English Dictionary*) චිල්ඩරිස් වස්කඩුවේ ශ්‍රී සුභූති හා හික්කඩුවේ ශ්‍රී සුමංගල යන හිමිවරුන්ගෙන් පාලි භාෂාව ඉගෙන ගත් අතර බ්‍රිතානය පරිපාලන සේවකයන් පාලි භාෂාව ඉගෙනීමට උනන්දු කළේය.
6. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ (Jsoss) සඟරාව 507, ශ්‍රීලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම, ඉංග්‍රීසි හා සිංහල භාෂාද්වයෙන්ම (bilingual) සකස් කර ඇත. 1902-2002
7. ශ්‍රීලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ (Jsoss) සඟරාව 507, ශ්‍රීලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම, (ඉංග්‍රීසි හා සිංහල භාෂාද්වයෙන්ම (bilingual) සකස් කර ඇත.1902-2002 පි :812
8. Ratna Handurakanda, “Orientalia in the University” *The Sri Lanka Orientation studies golden jubilee commemoration* Double volume, (xvii and xviii) No:1 and 2, University of Peradeniya, 1991- 1992
9. Ratna Handurakanda, “Orientalia in the University” *The Sri Lanka orientation studies golden jubilee commemoration* Double volume, (xvii and xviii) No:1 and 2, University of Peradeniya, 1991- 1992, p272
10. Ratna Handurakanda, “Orientalia in the University” *The Sri Lanka orientation studies golden jubilee commemoration* Double volume, (xvii and xviii) No:1 and 2, University of Peradeniya, 1991- 1992,p273
11. බොහෝ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ පශ්චාත් උපාධි එංගලන්තයේ ඔක්ස්පර්ඩ් හෝ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාල වල කෙරුණි.(SOAS)